# කාර්ය සාධන වාර්තාව

# 2013

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

## දැක්ම

ජනතා ව්‍යවසායක් ලෙස තිරසාර සංවර්ධනයට

සමුපකාරය

## මෙහෙවර

ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය

ජනතා ව්‍යවසායක් ලෙස සංවර්ධනය කිරීම සඳහා

සානුබල සපයමින්,

සමුපකාර සමිතිවල යහ පාලනය

ගොඩනැගීම සඳහා

පුළුල් ලෙස මැදිහත් වීම.

# පෙරවදන

සමුපකාරය හා ශ්‍රී ලාංකික ප්‍රජාව අතර පවතින්නේ අවියෝජනීය සම්බන්ධතාවයකි. "සමුපකාරය" යන්න මෙරට ජනතාවට නුහුරු නුපුරුදු වදනක් නොවේ. එය 1904 වර්ෂයේ සිට මේ දක්වා ව්‍යාවහාරය තුළින් ජනතාවට ප්‍රියමනාප වදනක් වී තිබේ. විසිවන සියවසේ ආරම්භයේ සිට අධිරාජ්‍යවාදීන්ගේ ග්‍රහණයට ලක්ව සිටි මෙරට ජනතාවගේ ආර්ථික ගැටළු වලට විසඳුමක් වශයෙන් රජය විසින් හඳුන්වාදුන් උපාය මාර්ගයක් ලෙස මෙරට උපත ලැබූ සමුපකාරය පොදු ජනතාවට නිහඬ සේවයක් සලසන සංවිධානය විශේෂයකි. විශේෂයෙන් සමුපකාර සංවිධානයන්හි අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කර ගනිමින් තම සාමාජිකයාගේ අවශ්‍යතා සපුරාලන අතර එය රජයේ සුභ සාධක වැඩසටහන් වලදී දීප ව්‍යාප්තව පුළුල් ජාලයක් සහිත සමුපකාර ව්‍යාපාරය රජයට ලබා දෙන්නේ අනගි සහයකි.

මෙවන් විපුල මෙහෙවරක නිරත සමුපකාර ව්‍යාපාරය සංවර්ධනය කරමින් එය තිරසාර සංවර්ධනයට දායක කර ගැනීමේ අභිප්‍රාය සහිතව සමුපකාර සංවර්ධන දෙපර්තමේන්තුව (රේඛීය) කටයුතු කරනු ලබයි. සමුපකාර ව්‍යාපාරයේ උන්නතිය උදෙසා අතිශය කැපවීමෙන් උරදෙන මෙම දෙපාර්තමේන්තුව විසින් 2013 වසර සඳහා සකස් කරන ලද කාර්ය සාධන වාර්තාව මෙසේ ඔබ අතට පත් කිරීමට හැකිවීම ඉමහත් සතුටට කරුණකි.

2013 වර්ෂය වෙනුවෙන් ප්‍රකාශයට පත් කරනු ලබන මෙම වාර්තාවෙහි පරිච්ඡේද තුනක් මගින් වර්ෂය තුළ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව ඉටු කළ කාර්යන් පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවක් ඉදිරිපත් කර ඇත. එහි පළමු පරිච්ඡේදය මගින් දෙපාර්තමේන්තුවෙහි කාර්යයන් සහ අභ්‍යන්තර පරිපාලන පිළිබඳවත්, මානව සම්පත පිළිබඳවත්, දෙවන පරිච්ඡේදය මගින් දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කළ සංවර්ධන කටයුතු පිළිබඳවත්, තුන් වන පරිච්ඡේදය මගින් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කටයුතු සහ විගණනය යටතේ ක්‍රියාත්මක වන සමුපකාර සංගම් හා සමිති පිළිබඳවත් විස්තර ඉදිරිපත් කර ඇත. ඉහත පරිච්ඡේද වලින් විස්තරාත්මකව සඳහන් සඳහන් කර ඇති පරිදි දෙපාර්තමේන්තුවෙහි කාර්යයන් පහසු කර ගැනීම සඳහා වසර ගණනාවකට පසුව දෙපාර්තමේන්තුවටම අනන්‍යවූ සමුපකාර සංවර්ධන නිලධාරීන් පිරිසක් බඳවා ගැනීම ද, උපධිධාරීන්ට රැකියා ලබාදීමේ රජයේ වැඩසටහන යටතේ සංවර්ධන නිලධාරීන් පිරිසක් බඳවා ගැනීම ද තුළින් අප දෙපාර්තමේන්තුව සතු මානව සම්පත් ශක්තිමත් කර ගැනීමට හැකි වීම සුවිශේෂී කරුණක් ලෙස සඳහන් කළ හැකි අතර ග්‍රාමීය බැංකු, මුල්‍ය සමුපකාර සමිති වල යහපාලනය ගොඩනැගීම සඳහා දෙපාර්තමේන්තුව තුළ ග්‍රාමීය බැංකු නියාමන ඒකක්යක් ස්ථාපිත කිරීමද මෙම වසර තුළ සිදු වූ තවත් වැදගත් සිදුවීමකි.

මෙම සියළුම කාර්යන් 2013 වර්ෂය තුළ සාර්ථක කර ගැනීම සඳහා සහයෝගය දැක් වූ සැමට මාගේ කෘතඥතාවය පළ කරමි. විවිද අභියෝගයන් හා බාධාක හමුවේ මෙහෙවර ඉටු කිරීම සඳහා වර්ෂය තුළ දායකත්වය සැපයූ මාන්ඩලික නිළාධාරීන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයට ද මගේ සුවිශ්ෂි ස්තුතිය පුද කර සිටිම.

ඩී.ඩී. උපුල් ශාන්ත ද අල්විස්
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්

# පටුන


1. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
    - 1.1 දෙපාර්තමේන්තුවේ කාර්යයන්
    - 1.2 දෙපාර්තමේන්තුවේ ව්‍යුහය
    - 1.3 දෙපාර්තමේන්තුවේ පොදු පරිපාලනය
        - 1.3.1 කාර්ය මණ්ඩල සංඛ්‍යා හා පුරප්පාඩු
        - 1.3.2 නව පත්වීම් ලබා පැමිණි නිලධාරින්
        - 1.3.3 උසස් වීම් ලැබූ නිලධාරින්
        - 1.3.4 ස්ථාන මාරු වීම් ලබා පැමිණි නිලධාරින්
        - 1.3.5 කාර්ය මණ්ඩල විශ්‍රාම ගැන්වීම්
        - 1.3.6 ස්ථාන මාරු වී ගිය නිලධාරින්
    - 1.4 කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සහ සංවර්ධනය
        - 1.4.1 දේශීය පුහුණු
        - 1.4.2 විදේශීය පුහුණු

2. සංවර්ධන ක්‍රියාකාරකම්
    - 2.1 සමුපකාර සමිතිවල අතුරු ව්‍යාවස්ථා සංශෝධනය කිරීම
    - 2.2 සමුපකාර සමිති / සංගම් නිලවරණ පැවැත්වීම්
    - 2.3 සමුපකාර සමිතිවල ව්‍යවස්ථාපිත විගණන කටයුතු
    - 2.4 නීති කටයුතු
        - 2.4.1. වර්ෂය තුළ සමුපකාර සමිති/ සංගම් වල ආරවුල් බේරුම් කිරීම හා තීරක ප්‍රධානයන් බල ගැන්වීම
        - 2.4.2. වර්ෂය තුළ අවසන් වූ නඩු
        - 2.4.3. සමුපකාර සමිති / සංගම් පිළිබඳ පරීක්ෂණ
    - 2.5 අරමුදල් කළමනාකරණය
        - 2.5.1 සමුපකාර අරමුදල
        - 2.5.2 සමුපකාර අතිරික්ත අරමුදල
    - 2.6 2013 වර්ෂය සඳහා රජයේ අයවැය මගින් වෙන් කළ මූල්‍ය ප්‍රතිපාදන හා වියදම් දැරීම
    - 2.7 සංවර්ධන කටයුතු

3. ජාතික මට්ටමේ සමුපකාර සංවිධාන
    - 3.1. වර්ෂය තුළ ක්‍රියාත්මක සංගම්
    - 3.2. දීප ව්‍යාප්ත ප්‍රාථමික සමුපකාර සමිති
        - 3.2.1. දීප ව්‍යාප්ත මූල්‍ය සේවා සමුපකාර සමිති
        - 3.2.2. දීප ව්‍යාප්ත නිෂ්පාදන හා සේවා සමුපකාර සමිති

# 01 පරිච්ඡේදය

# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

1930 ඔක්තෝම්බර් මස 01 වන දින සමුපකාර දෙපාර්තමේන්තුව නමින් ආරම්භ වූ අප දෙපාර්තමේන්තුව 1945 වර්ෂයේ දී සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව නමින් ස්ථාපිත විය. වර්තමානයේ දී අංක 330, යූනියන් පෙදෙස, කොළඹ 02 දරන ස්ථානයෙහි පිහිටා ඇති සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

## 01. 1 දෙපාර්තමේන්තුවේ කාර්යයන්

- ❖ අන්තර් පළාත් හා සමස්ත ලංකා මට්ටමේ සමුපකාර සමිති, සංගම් ලියාපදිංචි කිරීම.
- ❖ ලියාපදිංචි සමුපකාර සමිති හා සංගම් වල ව්‍යවස්ථාපිත කටයුතු මෙහෙයවීම සහ සංවර්ධනයට අදාල කටයුතු සිදු කිරීම.
- ❖ පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු හා සම්බන්ධීකරණය වෙමින් ජාතික ප්‍රතිපත්තියක් තුළ සමුපකාර ව්‍යාපාරයේ කටයුතු මෙහෙයවීම.
- ❖ ජාතික සමුපකාර සංවර්ධන ක්‍රියාදාමයන්ට සහාය වීම.
- ❖ රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධනාත්මක දායකත්වයක් සැපයීම.

### ව්‍යවස්ථාපිත කටයුතු

- ❖ සමිති ලියාපදිංචි කිරීම
- ❖ සමිති ඒකාබද්ධ හා විබද්ධ කිරීම
- ❖ සාමාජිකත්වය පිළිබඳ කටයුතු
- ❖ අතුරු ව්‍යවස්ථා හා සංශෝධනයන් අනුමත කිරීම
- ❖ නිළවරණ කටයුතු
- ❖ මහා සභා කැඳවීම/ කාරක සභා කැඳවීම
- ❖ මහා සභා පැවැත්වීම/ වලංගු භාවය තීරණය කිරීම
- ❖ ලියාපදිංචි සමුපකාර සමිති විසුරුවා හැරීම
- ❖ තීරකකරණ කටයුතු සහ උසාවි බලගැන්වීම්
- ❖ සමුපකාර සමිති/ සංගම් වල වාර්ෂික විගණනයන් සිදු කිරීම

### කළමනාකරණයට අදාළ කටයුතු

- ❖ පාලක මණ්ඩල පත් කිරීම/ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත්කිරීම
- ❖ ගිණුම් කටයුතු පිළිබඳ අධීක්ෂණය
- ❖ විගණන කටයුතු
- ❖ පනතේ විධිවිධාන පරිදි සාමාන්‍ය/ විශේෂ විභාග හා පරීක්ෂණ පැවැත්වීම
- ❖ කළමනාකරණ අධ්‍යාපනය සහ උපදෙස් දීම

### සම්බන්ධීකරණ කටයුතු

- ❖ සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය හා වෙනත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය.
- ❖ පළාත් සමුපකාර අමාත්‍යවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන් හා පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරුන් සමඟ සම්බන්ධීකරණය සඳහා සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශයට සහය වීම.
- ❖ ජාත්‍යන්තර සමුපකාර සන්ධානය සහ විදේශීය සමුපකාර ආයතන සම්බන්ධීකරණය
- ❖ සමුපකාර ග්‍රාමීය බැංකු හා සමුපකාර මූල්‍ය ආයතන පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සම්බන්ධීකරණය
- ❖ සමුපකාර සමිති වලට අදාල සංඛ්‍යා ලේඛන පිළිබඳව මහ බැංකුව හා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය
- ❖ වී මිලදී ගැනීම, සහන මිලට පොහොර බෙදාහැරීම වැනි කටයුතු වලදී සමුපකාර සමිති, කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණය කිරීම
- ❖ සමුපකාර සමිති/ සංගම් අතර සම්බන්ධීකරණය

### සංවර්ධන කටයුතු

- ❖ වාර්ෂික අයවැය ප්‍රතිපාදන අනුව ජාතික මට්ටමේ සහ පළාත් මට්ටමේ සංවර්ධන කාර්යයන් ඉටුකිරීම.
- ❖ සමුපකාර සමිති වල යහ පාලනය සහතික කිරීමට අදාල කටයුතු ඉටු කිරීම.
- ❖ සමුපකාර සමිති හා සංගම් වල සංවර්ධනය සඳහා සංවර්ධන උපදේශන සේවා සැපයීම.
- ❖ සමුපකාර සමිති හා සංගම් වල මූල්‍ය හා මෙහෙයුම් ක්‍රියාකාරකම් අධීක්ෂණය.
- ❖ සංවර්ධන ව්‍යපෘති ක්‍රියාත්මක කිරීම.
- ❖ සංවර්ධන ආධාර හා සානුබල සැපයීම.
- ❖ සංවර්ධන මාර්ගෝපදේශ සැපයීම හා සම්බන්ධීකරණය.
- ❖ සමුපකාර ක්ෂේත්‍රයේ සහ දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය.
- ❖ සේවක / නිලධාරි සුභ සාධනය.

## අරමුදල් පාලනය

- ❖ දෙපාර්තමේන්තුව යටතේ ඇති සමුපකාර අරමුදල සහ අතිරික්ත අරමුදල කළමනාකරණය හා පාලනය.
- ❖ ව්‍යවස්ථාපිත සමිති වල වාර්ෂික විගණනයෙන් පසු වෙන්කරනු ලබන දායක මුදල් අයකර ගැනීම.
- ❖ සමුපකාර සමිතිවල සංවර්ධන ව්‍යාපෘති හා පුහුණු කටයුතු සඳහා ණය සහ ආධාර ලබා දීම.
- ❖ ණය ආපසු අයකරගැනීම.
- ❖ ඵලදායි ලෙස අරමුදල් ආයෝජනය කිරීම.

## අභ්‍යන්තර පරිපාලන හා කළමනාකරණ කටයුතු


- ❖ සාමාන්‍ය පරිපාලනය.
- ❖ මානව සම්පත් කළමනාකරණය.
- ❖ කාර්ය සාධනය වර්ධනය.
- ❖ වත්කම් කළමනාකරණය.

## 01. 2 දෙපාර්තමේන්තුවේ ව්‍යුහය

2013 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ කාර්යභාරය අංශ 09 ක් ලෙස සංවිධානය වී ක්‍රියාත්මක වී ඇත. එනම්,

1. පරිපාලන අංශය
2. මුදල් අංශය
3. සංවර්ධන අංශය
4. විගණන අංශය
5. නීති අංශය
6. අරමුදල් අංශය
7. බැංකු නියාමන අංශය
8. ව්‍යාපෘති අංශය
9. සැලසුම් අංශය

# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



## 01. 3 දෙපාර්තමේන්තුවේ පොදු පරිපාලනය

අප දෙපාර්තමේන්තුවෙහි පරිපාලන ව්‍යුහයෙහි මෙම වසර තුළ සිදු වූ සුවිශේෂී වූ සිදුවීම් කිහිපයකි.

එනම් වසර 25කට පසුව සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු පුරප්පාඩු සඳහා සමුපකාර සංවර්ධන නිලධාරීන් 24 දෙනෙකු බඳවා ගැනීමට හැකිවීම මෙම වසර තුළ සිදු වූ සුවිශේෂ සිදුවීමක් වන අතර එසේම එම නිලධාරීන් සඳහා පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනය මඟින් පුහුණුව ලබාදීම තුළින් නිවැරදි සේවාවක් අප දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට හැකිවීම ද සුවිශේෂත්වයකි.

තවද උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ ව්‍යාපෘතියට අනුව සංවර්ධන නිලධාරී ලෙසින් දිවයින පුරා බඳවා ගනු ලැබූ සංවර්ධන නිලධාරී තනතුරු 15ක් අප දෙපාර්තමේන්තුවට අනුමත කිරීම මෙම වසර තුළ සිදු වූ අතර ඒ අනුව නව පත්වීම්ලාභී නිලධාරීන් 12 දෙනෙකු අප දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත වීමද මෙම වසර තුළ සිදු වූ තවත් සුවිශේෂී සිදුවීමකි.

එමෙන්ම සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුරු පුරප්පාඩු 02 ක් සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන්ට උසස්වීම් ලබාදීම මෙන්ම සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරී තනතුරු පුරප්පාඩු 03 ක් වෙනුවෙන් නිලධාරීන් උසස් කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම ද මෙම වසර තුළ සිදු කරන ලද වැදගත් කාර්යයක් වේ.

අප දෙපාර්තමේන්තුව සඳහා නව අංශයක් ලෙසින් ග්‍රාමීය බැංකු නියාමන ඒකකය ස්ථාපිත කිරීම ද මෙම වර්ෂයෙහි සිදු වූ තවත් විශේෂිත සිදුවීමකි.

## 01. 3.1 කාර්ය මණ්ඩල සංඛ්‍යා හා පුරප්පාඩු

මෙම දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු හා එම තනතුරුවල 2013-12-31 දිනට සේවය කළ සංඛ්‍යාව හා පුරප්පාඩු පහත පරිදි වේ.

| | තනතුර | අනුමත වර්තමාන සේවක සංඛ්‍යාව | 2013-12-31 දිනට සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (ශ්‍රී ලංකා පරිපාලන සේවය I) | 01 | 01 | - |
| 02 | සමුපකාර සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස් (ශ්‍රී ලංකා පරිපාලන සේවය II / III) | 04 | 02 | 02 |
| 03 | ගණකාධිකාරි (ශ්‍රී ලංකා ගණකාධිසේවය II / III) | 01 | - | 01 |
| 04 | නියෝජ්‍ය කොමසාරිස් / සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) | 03 | 03 | - |
| 05 | පරිපාලන නිලධාරි | 01 | 01 | - |
| 06 | භාෂා පරිවර්ථක | 01 | - | 01 |
| 07 | සමුපකාර සංවර්ධන නිලධාරී (අධි ශ්‍රේණිය) | 05 | - | 05 |
| 08 | සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර | 37 } 62* | 25 } 58* | 04 |
| 09 | සමුපකාර සංවර්ධන නිලධාරි | 25 | 33 | |
| 10 | සංවර්ධන නිලධාරි | 15 | 12 | 03 |
| 11 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 28 | 21 | 07 |
| 12 | රියදුරු | 05 | 05 | - |
| 13 | කාර්යාල කාර්ය සහායක | 15 | 11 | 04 |
| | **උප එකතුව** | **141** | **114** | **27** |

* කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/C/6/5/16 හා 2010-06-10 දිනැති ලිපියෙහි අනුමැතිය මත සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර තනතුරු 37න් පුරප්පාඩු වන තනතුරු සමුපකාර සංවර්ධන නිලධාරි බඳවාගැනීම් වලින් පිරවීමට කටයුතු කර ඇත.

## 01.3.2 නව පත්වීම් ලබා පැමිණි නිලධාරීන්

| | නම | තනතුර | පැමිණි දිනය |
|---|---|---|---|
| 1 | ජී.පී.ටී.පී ගනේගොඩ මෙය | සංවර්ධන නිලධාරි | 2013-03-19 |
| 2 | එල්.ජී.එස්.එස්. ලියනාරච්චි මෙය | සංවර්ධන නිලධාරි | 2013-04-16 |
| 3 | එල්.ජී.එම්.බී. ලංසකාර මිය | සංවර්ධන නිලධාරි | 2013-04-16 |
| 4 | එච්.එම්.පී.එම්. රූපරත්න මෙය | සංවර්ධන නිලධාරි | 2013-04-16 |
| 5 | එච්.එම්.එස්. බණ්ඩාර මිය | සංවර්ධන නිලධාරි | 2013-04-26 |
| 6 | කේ.ආර්.ටී. සෝමරත්න මෙය | සංවර්ධන නිලධාරි | 2013-04-26 |
| 7 | ඒ.ජී.එම්.එම්. තිලකරත්න මෙය | සංවර්ධන නිලධාරි | 2013-05-10 |
| 8 | එච්.එම්.එස්.එස්. බණ්ඩාර මිය | සංවර්ධන නිලධාරි | 2013-05-28 |
| 9 | ඩබ්ලිව්.ආර්.එම්. පෙරේරා මෙය | සංවර්ධන නිලධාරි | 2013-09-23 |
| 10 | එච්.එන්.ජී.එස්. හේරත් මිය | සංවර්ධන නිලධාරි | 2013-09-23 |
| 11 | එච්.එන්.එල්. ජයසිංහ මිය | සංවර්ධන නිලධාරි | 2013-09-23 |
| 12 | එස්.එච්.එස්. ජයසිංහ මෙය | සංවර්ධන නිලධාරි | 2013-09-23 |
| 13 | යු.එස්.ජී. විජේකෝන් මෙය | ස.සං.නි. III | 2013-05-02 |
| 14 | ඒ.අයි.ජී. අදිකාරි මයා | ස.සං.නි. III | 2013-05-02 |
| 15 | ජී.එච්.ජී. විජේසිංහ මෙය | ස.සං.නි. III | 2013-05-02 |
| 16 | එෆ්.බී.අයි.ජී දිල්රුක්ෂි මෙය | ස.සං.නි. III | 2013-05-02 |
| 17 | එච්.එම්.එම්.සී. හේරත් මෙය | ස.සං.නි. III | 2013-05-02 |
| 18 | ජී.ආර්.ආර්. පතිරගේ මයා | ස.සං.නි. III | 2013-05-02 |
| 19 | පී.ඩී.ටී.එම්. ද සිල්වා මෙය | ස.සං.නි. III | 2013-05-02 |
| 20 | එන්.එස්. සුදසිංහ මෙය | ස.සං.නි. III | 2013-05-02 |
| 21 | ටී.ජී.එල් ගුණරත්න මෙය | ස.සං.නි. III | 2013-05-02 |
| 22 | ආර්.ජී. එරන්දිකා හර්ෂණී මෙය | ස.සං.නි. III | 2013-05-02 |
| 23 | බී.ආර්. තරංගනී මෙය | ස.සං.නි. III | 2013-05-02 |
| 24 | ඒ.එස්.ජී. සජීවනි මෙය | ස.සං.නි. III | 2013-05-02 |
| 25 | ඒ. එස්. කළුතරගේ මෙය | ස.සං.නි. III | 2013-05-02 |
| 26 | ඩී.එම්.එස්.සී.බී දහනායක මයා | ස.සං.නි. III | 2013-05-02 |
| 27 | එච්.එම්.ජී.පී හේරත් මෙය | ස.සං.නි. III | 2013-05-02 |
| 28 | එම්.ඩී.පී. තමාලි මෙය | ස.සං.නි. III | 2013-06-03 |
| 29 | ඒ.සී.බී ජයංගා මෙය | ස.සං.නි. III | 2013-06-03 |
| 30 | ඊ.එම්.ජී.සී. ඒකනායක මයා | ස.සං.නි. III | 2013-06-03 |

| | නම | තනතුර | පැමිණි දිනය |
|---|---|---|---|
| 31 | ඩබ්ලිව්.එම්.එම්.එස්. ප්‍රනාන්දු මෙය | ස.සං.නි. III | 2013-06-03 |
| 32 | කේ.කේ.සී. හේරත් මෙය | ස.සං.නි. III | 2013-06-03 |
| 33 | සී.එච්.ටී. තමාලිකා මෙය | ස.සං.නි. III | 2013-06-03 |
| 34 | ජේ.එම්.පී.පී ජයසුන්දර මෙය | ස.සං.නි. III | 2013-06-03 |
| 35 | කේ.ඒ.ඩී.පී.එල්.කහඳවල මයා | ස.සං.නි. III | 2013-06-26 |
| 36 | ජේ.එල්.එන්.ඩී. ජයසිංහ මිය | ස.සං.නි. III | 2013-06-26 |
| 37 | ටී.එම්.එම්.කේ. තෙන්නකෝන් මයා | කා.කා.ස. | 2013-04-02 |
| 38 | එම්.එම්.එම්.කේ. සූරියබණ්ඩාර මයා | කා.කා.ස. | 2013-04-02 |
| 39 | එන්.ඒ. එන්. ජයතිලක මයා | කා.කා.ස. | 2013-04-02 |
| 40 | එච්.ආර්.ජේ.එස්. සූරියබණ්ඩාර මයා | කා.කා.ස. | 2013-04-02 |

## 01. 3.3 උසස්වීම් ලැබූ නිලධාරීන්

සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් තනතුරු දෙකක් සඳහා 2013 වසර තුළ උසස්වීම් ලබා දී ඇත.

| | නම | උසස්වීමට පෙර තනතුර | උසස්වීමට පසු තනතුර | උසස්වීම් ලද දිනය |
|---|---|---|---|---|
| 01 | එච්.ඒ.ජේ.එස්.එම්. අබේනායක මයා | දිස්ත්‍රික් නිලධාරි | සහකාර කොමසාරිස් | 2013-09-13 |
| 02 | ජී.ජී. දයාසුමන මයා | දිස්ත්‍රික් නිලධාරි | සහකාර කොමසාරිස් | 2013-09-13 |

## 01. 3.4 ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරීන්

| | නම | තනතුර | ස්ථාන මාරුවී පැමිණි දිනය |
|---|---|---|---|
| 1 | ටී.එච්.එන්. සපිඩීන් මයා | කා.කා.ස. | 2013-01-01 |
| 2 | එස්. සිරිවර්ධන මයා | කා.කා.ස. | 2013-01-11 |
| 3 | එල්.සී.එච්.අයි. ද සිල්වා මිය | රා.ක.ස. | 2013-02-08 |
| 4 | ජේ.එම්.එච්.එන්.ජී. ජයසේකර මෙය | සහකාර කොමසාරිස් (ශ්‍රී.ලං.පරි.සේ) | 2013-04-05 |
| 5 | එම්.ඒ.ඩී.අයි මාරසිංහ මයා | ස.ප්‍ර.වි.ස | 2013-05-02 |
| 6 | එම්.එම්. පෙරේරා මිය | රා.ක.ස. | 2013-08-07 |
| 7 | එච්.ජී. වීරරත්න මයා | කා.කා.ස. I | 2013-08-08 |

## 01. 3.5 කාර්ය මණ්ඩල විශ්‍රාම ගැන්වීම

| | නම | තනතුර | විශ්‍රාම ලැබූ දිනය |
|---|---|---|---|
| 01 | එම්.බී.එම් උබේතුංග බණ්ඩාර මයා | දිස්ත්‍රික් නිලධාරි (රාජකාරි ආවරණ) | 2013-06-24 |
| 02 | වී.හෙට්ටිආරච්චි මයා | කා.කා.ස. I | 2013-11-03 |

## 01. 3.6 ස්ථාන මාරු වී ගිය නිලධාරින්

| | නම | තනතුර | ස්ථාන මාරුවී ගිය දිනය |
|---|---|---|---|
| 1 | එච්.ජී. වීරරත්න මයා | කා.කා.ස. I | 2013-01-02 |
| 2 | ඩබ්ලිව්. පී. කේ. ගුණරත්න මිය | රා.ක.ස. I | 2013-01-21 |
| 3 | කේ.එල්.ඩී.අසේල මයා | සහකාර කොමසාරිස් (ශ්‍රී.ලං.පරි.සේ) | 2013-04-02 |
| 4 | ජේ.ඩී.එම්.ජේ. පෙරේරා මෙය | ස. ප්‍ර. වි. ස | 2013-04-02 |
| 5 | එම්.ජී.ඕ.බී. ගමගේ මයා | ස. සං නි. | 2013-06-07 |

## 01. 4 කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සහ සංවර්ධනය

### 01. 4.1 දේශීය පුහුණු

2013 වර්ෂය තුළ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල සාමාජිකයන් පහත සඳහන් පරිදි දේශීය අධ්‍යාපන හා පුහුණු පාඨමාලාවන්ට සහභාගි කරවා ඇත.

| | පුහුණු වැඩසටහන | ආයතනය | පැවැත්වූ දිනය | සහභාගි වූ පිරිස |
|---|---|---|---|---|
| 1 | වැටුප් පරිවර්ථන | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 2013.03.11 | ඒ.ඒ.සි.එස්. අමරසිංහ මෙය (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 2 | ප්‍රවාහන කළමනාකරණය | නිපුනතා සංවර්ධන අරමුදල් ආයතනය | 2013-06-20 | ඒ.ජී.යූ.නිශාන්ත මයා (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 3 | ගබඩා කළමනාකරණය | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය | 2013.07.05 සිට (සිකුරාදා දින 07ක්) | කේ.ඒ.එන්. රත්නායක මයා (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 4 | රියදුරන් සඳහා වූ වැඩමුළුව | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය | 2013-07-25 | එම්.ඩී. නිරෝෂන් මයා (රියදුරු) |
| 5 | රාජ්‍ය ලේඛන පරිපාලන සහ ලේඛනාරක්ෂක නීතිය පිළිබඳ වැඩමුළුව | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව | 2013-09-06 | ජේ.එම්.එච්.එන්.ජී. ජයසේකර මෙය (සහකාර කොමසාරිස්) |
| 6 | රජයේ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ පුහුණු පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2013-09-09<br>2013-09-10 | කේ.ඒ.එන්. රත්නායක මයා<br>බී. ප්‍රේමරත්න මයා<br>(රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 7 | ලේඛනකරණ නිපුනතා සංවර්ධනය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 2013-09-30 | එස්.ඒ. තලංගම මයා (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 8 | යහපාලනය හා නායකත්ව පිළිබඳ ජාතික පුහුණු වැඩමුළුව | ශ්‍රී ලංකා පදනම් ආයතනය | 2013-11-26<br>2013-11-27 | පී.ඒ. සරත් ආනන්ද මයා (දිස්ත්‍රික් නිලධාරී) |
| 9 | කාර්යාල කාර්ය සහයක සේවයේ කාර්යාභිවර්ධනය පිළිබඳ පුහුණු පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2013-11-04 සිට 2013-11-06 | නිමල් ජයතිලක මයා<br>මහින්ද සූරිය බණ්ඩාර මයා<br>(කාර්යාල කාර්ය සහයක) |
| 10 | කාර්යාල කළමනාකරණය සහ කාර්යාල ක්‍රමවේදය | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2013-11-26<br>2013-11-27 | එල්.ඒ.ඩී. සිල්වා මිය<br>ඒ.ඒ.සී.එස්. අමරසිංහ මිය<br>(රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 11 | යහපාලනය හා නායකත්ව පිළිබඳ ජාතික පුහුණු වැඩමුළුව | ශ්‍රී ලංකා පදනම් ආයතනය | 2013-11-28<br>2013-11-29 | එම්.ආර්. ප්‍රියන්තා පීරිස් මිය<br>බී.එම්.එම්. බන්දුල මයා<br>(සමුපකාර සංවර්ධන නිලධාරි) |

## 01. 4.2 විදේශීය පුහුණු

2013 වර්ෂය තුළ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල සාමාජිකයන් පහත සඳහන් පරිදි විදේශීය අධ්‍යාපන, පුහුණු, ශිෂ්‍යත්ව හා සම්මන්ත්‍රන සඳහා සහභාගවී ඇත.

| | පුහුණු වැඩසටහන | කාල පරිච්ජේදය | සහභාගි වූ නිලධාරීන් |
|---|---|---|---|
| 01 | China and Thailand co-opertaive Study Tour | 27-03-2013<br>03-04-2013 | Mr. W.H. Karunarathna (Commissioner of co-operative Development and Registrar of co-operative societies)<br>Mr. G.G. Dayasumana (co-operative development district officer) |
| 02 | Co-operative activities and New co-operative Study tour of Studying co-operative activities and New Tendency (Vietnam) | 02-06-2013<br>08-06-2013 | Mr. M.B.M. Ubethunga Bandara (co-operative development district officer) |
| 03 | Refresh or on Restituting and strengthening of agricultural and Rural financing institutions of the Trainees (India) | 15-07-2013<br>19-07-2013 | Mrs. P.C. Rajapaksha<br>Mrs. H.T. Sooriyathilaka (co-operative promotion and investigation assistant) |
| 04 | Rural development for small-scale farmers through agricultural co-operative activity in Asia (Japan) | 21-08-2013<br>23-10-2013 | Mr. P.H.S. Rodrigu (co-operative promotion and investigation assistant) |
| 05 | Rural credit for poverty reduction (Hyderabad) | 02-09-2013<br>23-09-2013 | Ms. T.N.K. Senarathna (co-operative promotion and investigation assistant) |
| 06 | Co-operative rural bank study tour (Thailand) | 27-09-2013<br>01-10-2013 | Mrs. P.I. kurera (co-operative development district officer) |
| 07 | Asia Pacific co-operative registrars conference (Malaysia) | 09-12-2013<br>13-12-2013 | Mr. W.H. Karunarathna (Commissioner of co-operative Development and Registrar of co-operative societies) |

## මහජන බැංකු ආධාර මගින් සිදු කරනු ලැබූ පුහුණු වැඩසටහන්

| | පුහුණු වැඩසටහන | පැවැත් වූ දිනය | සහභාගි වූ පිරිස |
|---|---|---|---|
| 01 | කාර්යාල ක්‍රම, ගිණුම් ක්‍රම සහ කාර්යාල ක්‍රම තුල පරිගණක හැකියාව පිළිබඳ වැඩමුළුව | 2013-01-06 සිට 2013-01-10 දක්වා | දෙපාර්තමේන්තු නිලධාරින් |
| 02 | සමුපකාර සමිති/සංගම් වල අතුරු ව්‍යවස්ථා සවිමත් කිරීමේ වැඩමුළුව | 2013-02-24 | දෙපාර්තමේන්තු නිලධාරින් |
| 03 | සමූපදීපනී දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරින් දැනුවත් කිරීමේ වැඩමුළුව | 2013-02-26<br>2013-02-27 | දෙපාර්තමේන්තු නිලධාරින්<br>පළාත් දෙපාර්තමේන්තු නිලධාරින් |
| 04 | සී/ස කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිති මහා සංගමය ප්‍රතිසංවිධානය කිරීම සහ දීප ව්‍යාප්ත කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිති නගා සිටුවීමේ වැඩසටහන් | 2013-03-01<br>2013-03-02 | කිරි සමිති සාමාජිකයින්<br>දෙපාර්මේන්තු නිලධාරින් |
| 05 | සංඛ්‍යා ලේඛන වැඩමුළුව | 2013-04-29 | දෙපාර්තමේන්තු නිලධාරින්/ පළාත් දෙපාර්තමේන්තු නිලධාරින් |
| 06 | සංඛ්‍යා ලේඛන වැඩමුළුව | 2013-06-13 | දෙපාර්තමේන්තු නිලධාරින්/ පළාත් දෙපාර්තමේන්තු නිලධාරින් |
| 07 | විගණකවරුන් දැනුවත් කිරිමේ වැඩමුළුව | 2013-08-22 | දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර නිලධාරින් |
| 08 | විගණකවරුන් දැනුවත් කිරිමේ වැඩමුළුව | 2013-09-26 | දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර නිලධාරින් |
| 09 | විගණකවරුන් දැනුවත් කිරිමේ වැඩමුළුව | 2013-10-29 | දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර නිලධාරින් |
| 10 | ගිණුම් ප්‍රතිපත්ති සකස් කිරිමේ වැඩමුළුව | 2013-11-13 | සමිති / සංගම් නිලධාරින් |
| 11 | ධනාත්මක ආකල්ප වර්ධන වැඩමුළුව | 2013-12-20 | දෙපාර්තමේන්තු නිලධාරින්<br>සමිති / සංගම් නිලධාරින් |
| 12 | ඉංග්‍රීසි පුහුණු පාඨමාලාව 1 අදියර | 2013-01-02 සිට 2013-06-12 දක්වා (සතියට දින 01) | දෙපාර්තමේන්තු නිලධාරින් |
| 13 | ඉංග්‍රීසි පුහුණු පාඨමාලාව 2 අදියර | 2013-08-06 සිට 2013-12-18 දක්වා (සතියට දින 01) | දෙපාර්තමේන්තු නිලධාරින් |

# 02 පරිච්ඡේදය

## සංවර්ධන ක්‍රියාකාරකම්

### 02.1 සමුපකාර සමිතිවල අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම

2013 වර්ෂය තුළදී පහත සඳහන් සමුපකාර සමිති වල අතුරු ව්‍යවස්ථා සංශෝධනයන් අනුමත කරන ලදී.

- සී/ස රාජ්‍ය සේවා සමුපකාර ණයදීමේ හා ඉතිරි කිරීමේ සමිතිය 2013-02-21
- සී/ස තැපැල් හා ටෙලිකොම් සේවක බැංකු සමිතිය 2013-05-24
- සී/ස ශ්‍රී ලංකා වරාය අධිකාරිය සේවකයින්ගේ සුභ සාධක සකසුරුවම්කම හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය 2013-10-04
- සී/ස මහජන බැංකු සේවක සමුපකාර සමිතිය 2013-11-07
- සී/ස බ්‍රවුන් හවුලේ කාර්මික හා පොදු සේවා සමුපකාර සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය 2013-12-10
- සී/ස දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ ඉතිරි කිරීමේ සමුපකාර බැංකුව 2013-12-30


### 02.2 සමුපකාර සමිති සංගම් නිලවරණ පැවැත්වීම්

- සී/ස ලංගම සේවක ස.ණ.ස 2013-04-09
- සී/ස වරාය නැව් සේවා සමුපකාර සමිතිය 2013-08-01
- සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තු සේවක ස.ණ.ස 2013-11-23

### 02.3 සමුපකාර සමිති වල ව්‍යවස්ථාපිත විගණන කටයුතු

මෙම දෙපාර්තමේන්තුවේ ව්‍යවස්ථාපිත විගණන කටයුතු යටතේ විගණනය කළ යුතු ප්‍රාථමික සමුපකාර සමිති / සංගම් වල 2009 සිට 2013 වර්ෂය දක්වා විගණන සැලසුම් සහ නිත්‍ය ප්‍රතිඵල පහත දැක්වේ.

| වර්ෂය | සැලසුම් කල විගණන | නිම කල විගණන | වර්ෂය තුල නිම කළ විගණනයන්හි ප්‍රතිශතය |
|---|---|---|---|
| 2009 | 55 | 45 | 82% |
| 2010 | 58 | 53 | 91% |
| 2011 | 66 | 64 | 97% |
| 2012 | 83 | 63 | 76% |
| 2013 | 74 | 61 | 82% |




## 02. 4 නීති කටයුතු

නීති කටයුතු වලට අදාළ ප්‍රධාන කාර්යයන් පහත පරිදි සංක්ෂිප්ත කර දැක්විය හැකිය.

- ❖ සමුපකාර සමිති වලට සම්බන්ධ නීති රීති හා ව්‍යවස්ථා සම්බන්ධයෙන් අර්ථකතනයන් ඉදිරිපත් කිරීම හා පළාත් කොමසාරිස්වරුන් ඉදිරිපත් කරන නෛතික ගැටළු පිළිබඳ අවශ්‍ය සහාය ලබාදීම
- ❖ ආදර්ශ අතුරු ව්‍යවස්ථා සකස් කිරීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම ලබාදීම
- ❖ ලියාපදිංචිය සඳහා ඉදිරිපත්කරන අතුරු ව්‍යවස්ථා සඳහා නිර්දේශ ලබාදීම
- ❖ අතුරු ව්‍යවස්ථා සංශෝධන සඳහා නිර්දේශ ලබාදීම
- ❖ සමුපකර පනතේ 58 වැනි වගන්තිය යටතේ සමුපකාර සමිති/ සංගම් වලින් ඉදිරිපත් කරන තීරක ආරවුල් විභාග කිරීම, ප්‍රධානයන් ලබාදීම, අභියාචනා විභාග කිරීම හා උසාවි බල ගැන්වීම
- ❖ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරින්, වග උත්තරකරුවන් කරමින් දිස්ත්‍රික් උසාවි, අභියාචනාධිකරණ සහ ශ්‍රේෂ්ඨාධිකරණ වලින් ඉදිරිපත් කරන නඩු සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ සහාය ලබාගෙන අවශ්‍ය කටයුතු කිරීම.

## 02. 4.1 වර්ෂය තුළ සමුපකාර සමිති/සංගම් වල ආරවුල් බේරුම් කිරීම හා තීරක ප්‍රදානයන් බලගැන්වීම

- බේරුම් කර ඇති ආරවුල් සංඛ්‍යාව — ගොනු 192
- උසාවි බලගන්වා ඇති ප්‍රදාන සංඛ්‍යාව — ගොනු 372
- උසාවි බලගන්වා ඇති ප්‍රදානයන්හී වටිනාකම — රුපියල් මිලියන 06

## 02. 4.2 වර්ෂය තුළ අවසන් වූ නඩු

| නඩු අංකය | | පාර්ශවකාර සමිතිය |
|---|---|---|
| D.S.P. 185/2911 | - | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය. |
| WP/HCLA/CO/70/2011 (LA) | - | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය. |
| DC/170/2009 | - | සී/ස සතොස සේවකයින්ගේ සමුපකාර සකසුරුවම් සුභ සාධක සහ ණය දෙන සමිතිය |

## 02. 4.3 සමුපකාර සමිති/ සංගම් පිළිබඳ පරීක්ෂණ

සී/ස සතොස සේවකයින්ගේ සමුපකාර සකසුරුවම් සුභ සාධක සහ ණය දෙන සමිතියට අදාළව 2013 වසර තුළ සමුපකාර සමිති පනතේ 46(1) වගන්තිය යටතේ පරීක්ෂණයක් ආරම්භ කළ අතර ඊට අමතරව සමිති වලින් සහ විවිධ පාර්ශවයන් වෙතින් ලැබෙන පෙත්සම් විභාග හා පරීක්ෂණ පැවැත්වීම සිදු කරන ලදී. එසේම මෙම වර්ෂය තුළ සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම් හා ණය ගණුදෙනු සමිතියට අදාළව පවත්වන ලද 46(1) පරීක්ෂණය ද අවසන් කර ඇත.

## 02. 5 අරමුදල් කළමනාකරණය

1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 43 (1) (ආ) වගන්තිය සහ 57 (3) වගන්තිය යටතේ පිහිටුවන ලද පහත සඳහන් අරමුදල් මෙම වර්ෂය තුළදී ද සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා භාරයේ පැවති අතර, එම අරමුදලේ දායක මුදල් අයකර ගැනීම මෙන්ම වියදම් දැරීම, ආයෝජන, ණය හා ආධාර සැපයීම යන කාර්යයන් ගරු අමාත්‍යතුමාගේ අධීක්ෂණය හා විධානයට යටත්ව අමාත්‍යාංශ ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුත් අරමුදල් කමිටුවේ තීරණ අනුව කළමනාකරණය කරන ලදී.

- සමුපකාර අරමුදල
- සමුපකාර අතිරික්ත අරමුදල

## 02. 5.1 සමුපකාර අරමුදල

සමුපකාර සමිති ආඥා පනතේ (107 වැනි අධිකාරිය) 46 වගන්තිය යටතේ පනවා ඇති අංක 10086 සහ 1950.03.24 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ පලකරන ලද නියෝග මාලාව යටතේ පිහිටුවා ඇති මෙම අරමුදල ගරු අමාත්‍යතුමාගේ විධානයන්ට යටත්ව සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා විසින් කළමණාකරනය කරනු ලබයි.

මධ්‍යම රජයේ අරමුදලට දායකත්වය දෙනු ලබන්නේ මෙම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට යටත්වන සමුපකාර සංගම් හා දීප ව්‍යාප්ත සමුපකාර සමිති විසිනි. 2013 වර්ෂය තුළදී එම සමිති වලින් මෙම අරමුදල සඳහා ලැබී ඇති සමිති දායකත්වය රුපියල් මිලියන 68.7 කි.

**වසර තුළදී සමුපකාර අරමුදලින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්**

| | ක්‍රියාත්මක කරන ලද වැඩසටහන | වියදම් දැරීම් (රු.මි.) |
|---|---|---|
| 01 | ග්‍රාමීය බැංකු නියාමන වැඩසටහන් | 0.01 |
| 02 | විදේශීය පුහුණු වැඩසටහන් | 5.61 |
| 03 | දැයට කිරුළ සංවර්ධන වැඩසටහන | 0.108 |
| | **එකතුව** | **5.728** |

## 02. 5.2 සමුපකාර අතිරික්ත අරමුදල

1972 අංක 05 දරන සමුපකාර පනතේ 57(3) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව මෙම අරමුදල සංස්ථාපනය වී ඇති අතර අංක 93/5 දරන 1974 ජනවාරි 10 දිනැති විශේෂ ගැසට් පත්‍රයේ 44(I) සිට 44 (III) දක්වා සඳහන්ව ඇති ලියාපදිංචි සමිතියක් ඈවර කිරීම අවසන් කරනු ලැබූ හා එකී සමිතියේ යම් ණය හිමියෙක් විසින් වත්කම් බෙදාදීමේ යෝජනා ක්‍රමය යටතේ තමාට අයවිය යුතු දේ සම්බන්ධයෙන් හිමිකම් කියාපෑම ඉදිරිපත් කරනු නොලැබ ඉතිරිවන අතිරික්තයක් යෙදවීමෙන් මෙකී සමුපකාර අතිරික්ත අරමුදල මූල්‍යනය වේ.

මෙම අරමුදලින් වර්ෂය තුලදී පළාත් සභා යටතේ ලියාපදිංචි සමුපකාර සමිති වල කටයුතු වැඩි දියුණු කිරීම සඳහා සහන පොලි ප්‍රතිශතයක් යටතේ පහත පරිදි මූල්‍ය ප්‍රතිපාදන සලසා ඇත.

## සමුපකාර අතිරික්ත අරමුදල - ණය ලබා දීම

| | ආයතනය | මෙම වසර තුළ ලබාදුන් ණයමුදල (රු.මි.) | කාරණය |
|---|---|---|---|
| 1 | සී/ස කුරුණෑගල සමුපකාර ආරෝග්‍යශාලා සමිතිය | 37.5 | සමුපකාර රෝහල් පද්ධතිය වැඩි දියුණු කිරීම |
| 2 | සී/ස කුරුණෑගල සමුපකාර ආරෝග්‍යශාලා සමිතිය | 50 | සමුපකාර රෝහල් පද්ධතිය වැඩි දියුණු කිරීම |
| 3 | සී/ස නිකවැරටිය සංවර්ධන සමුපකාර සමිතිය | 19.5 | සමුපකාර සමිති පාරිභෝගික අංශය ප්‍රවර්ධනය කිරීම |
| 4 | සී/ස රාජ්‍ය ඉංජිනේරු සංස්ථායීය ස.ණ.ස. | 3 | සමුපකාර සමිති ප්‍රවර්ධනය කිරීම |
| 5 | සී/ස ගාල්ල දිස්ත්‍රික්කයේ ආරෝග්‍යශාලීය සමුපකාර සමිතිය | 50 | සමුපකාර රෝහල් පද්ධතිය වැඩි දියුණු කිරීම |
| 6 | සී/ස කොබෙයිගනේ විවිධ සේවා සමුපකාර සමිතිය | 10 | සමුපකාර සමිති පාරිභෝගික අංශය ප්‍රවර්ධනය කිරීම |
| 7 | වී අලෙවි මණ්ඩලය | 300 | මහ කන්නයේ වී මිලදී ගැනීම |
| 8 | සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව | 75 | සමුපකාර සමිති වෙත බෙදා හැරීම සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදී ගැනීම |
| 9 | සී/ස ජාතික සමුපකාර සංවර්ධන ආයතනය | 20 | ශ්‍රවණාගාර ගොඩනැගිල්ල ඉදි කිරීම |
| | **එකතුව** | **565** | |

## සමුපකාර අතිරික්ත අරමුදල - ආධාර ලබාදීම

| | ලබාදුන් සමිති / ආයතන | මෙම වසර තුළ ලබාදුන් මුදල (රු.මි.) | විස්තරය |
|---|---|---|---|
| 1 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සණස සමිතිය | 2.5 | සමුපකාර අධ්‍යාපනය ව්‍යාප්තිය හා ප්‍රචාරණය සඳහා |
| 2 | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව - වයඹ පළාත | 11.7 | නිකවැරටිය මහසෙන් ජාතික පාසලෙහි පිහිණුම් තටාකය ඉදි කිරීම සඳහා |
| 3 | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව - වයඹ පළාත | 0.2 | කුරුණෑගල මලියදේව පිරිමි විද්‍යාලයෙහි සමුපකාර අධ්‍යාපනය ව්‍යාප්තිය හා ප්‍රචාරණය සඳහා |
| | **එකතුව** | **14.4** | |

## 02. 6 2013 වර්ෂය සඳහා රජයේ අයවැය මඟින් වෙන් කළ මූල්‍ය ප්‍රතිපාදන හා වියදම් දැරීම

### පුනරාවර්තන වියදම්

| වැය විෂය අංකය | කාණ්ඩය/වැය විෂයය / අයිතම විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන රු.මි. | 2013-12-31 දිනට මුළු වියදම රු.මි. |
|---|---|---|---|
| 1001 | වැටුප් හා වේතන | 20.75 | 20.72 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 0.76 | 0.75 |
| 1003 | වෙනත් දීමනා | 12.55 | 12.56 |
| 1101 | ගමන් වියදම් - දේශීය | 1.80 | 1.80 |
| 1102 | ගමන් වියදම් - විදේශීය | 0.65 | 0.65 |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 1.13 | 1.13 |
| 1202 | ඉන්ධන | 2.68 | 2.65 |
| 1203 | ආහාරපාන හා නිල ඇඳුම් | 0.05 | 0.05 |
| 1301 | වාහන | 1.81 | 1.81 |
| 1302 | යන්ත්‍ර සහ උපකරණ | 0.44 | 0.44 |
| 1402 | තැපැල් හා සන්නිවේදනය | 0.85 | 0.84 |
| 1403 | විදුලිය හා ජලය | 2.58 | 2.57 |
| 1405 | වෙනත් | 2.10 | 2.11 |
| 1505 | වෙනත් සම්මාදම් සහ දායක මුදල් | 0.34 | 0.34 |
| 1506 | රජයේ සේවකයන් සඳහා දේපල ණය පොලී | 0.46 | 0.46 |
| | **එකතුව** | **48.95** | **48.88** |

### මූලධන වියදම්

| වැය විෂය අංකය | කාණ්ඩය/වැය විෂයය / අයිතම විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන රු.මි. | 2013-12-31 දිනට මුළු වියදම රු.මි. |
|---|---|---|---|
| 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 0.10 | - |
| 2003 | වාහන | 0.70 | 0.67 |
| 2102 | ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 0.31 | 0.30 |
| 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 0.44 | 0.43 |
| 2401 | පුහුණු කිරීම් සහ හැකියා වර්ධනය | 0.20 | 0.14 |
| 2502-1 | සමුපකාර ප්‍රචාරණය - සමුපදීපනී පුවත්පත මුද්‍රණය | 7.46 | 7.46 |
| 2502-2 | මුදල් සේවා රෙගුලාසි | 3.45 | 3.0 |
| 2502-3 | සිසු ශක්ති වැඩසටහන | 0.75 | 0.73 |
| 2502-4 | කාර්ය සාධන වාර්තාව සහ සංඛ්‍යා ලේඛන වාර්ථාව මුද්‍රණය | 0.42 | 0.42 |
| 2502-6 | සමුපකාර සමිති පිහිටුවීම | 0.50 | 0.49 |
| 2502-8 | දැයට කිරුළ අධ්‍යාපන හා වෙළඳ ප්‍රදර්ශනය | 1.40 | 1.40 |
| | **එකතුව** | **15.73** | **15.04** |

### වියදම් එකතුව

| | විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන රු.මි. | 2013-12-31 දිනට මුළු වියදම රු.මි. |
|---|---|---|---|
| 01 | පුනරාවර්තන වියදම් එකතුව | 48.95 | 48.88 |
| 02 | මූලධන වියදම් එකතුව | 15.73 | 15.04 |
| | **මුළු එකතුව** | **64.68** | **63.92** |

## 02. 7 සංවර්ධන කටයුතු

මෙම වසර තුළදී දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලාංකේය සමුපකාරික ප්‍රජාව ඇතුළු සමස්ත ජනතාව වෙනුවෙන් මානව සම්පත් හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පුළුල් දායකත්වයක් සපයා ඇත. ඒ සඳහා වූ සංවර්ධන ව්‍යාපෘති රාශියක් 2013 වසර තුළදී ක්‍රියාත්මක වූ අතර එමඟින් ජනතාවට මහත් වූ ප්‍රතිලාභ රැසක් හිමි කර දී ඇත. එම සංවර්ධන කටයුතු පහත පරිදි වේ.

01. මෙගා කෝප්සිටි සුපිරි වෙළඳසැල් ආරම්භ කිරීම

දැයට කිරුළ අධ්‍යාපන හා වෙළඳ ප්‍රදර්ශනයට සමාගමීව මෙගා කෝප් සිටි සුපිරි වෙළඳසැල් ආරම්භ කිරීම සඳහා මෙම වසර තුළදී පියවර ගන්නා ලදී. ඒ අනුව මෙගා කෝප්සිටි 2ක් විවෘත කිරීමට හැකිවීම අප දෙපාර්තමේන්තුව ලද විශාල ජයග්‍රහණයකි.



මෙමඟින් සාමාන්‍ය ආර්ථික මට්ටමක සිට ඉහළ ආදායම් මට්ටමක් දක්වා වූ සෑම ප්‍රජාවක්ම ආවරණය වන පරිදි ප්‍රතිලාභ රැසක් ජනතාව වෙත අත්පත් කර දී ඇත. මෙගා කෝප් සිටි හරහා ගුණාත්මයෙන් ඉහළ භාණ්ඩ සහන මිලට ලබා ගැනීමට හැකිවීම සහ පෞද්ගලික අංශයෙන් සැපයෙන පහසුකම් සමුපකාර සමිති වල ගනුදෙණුකරුවන්ට ද හිමිවීම මෙහි ඇති සුවිශේෂී වූ ප්‍රතිලාභයකි. මෙගා කෝප් සිටි, සුපිරි වෙළඳ සැල් අතර ප්‍රමුඛස්ථානයට ගෙන එමින් ජනතාවට සේවයක් සැපයීම මෙහි ප්‍රධානතම අරමුණ වේ.

මේ සඳහා රජයේ මූලධන ප්‍රතිපදාන යටතේ රුපියල් මිලියන 5ක මුදලක් වැය වූ අතර සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ මූලධන ප්‍රතිපදාන යටතේ එක් මෙගා කෝප් සිටි සුපිරි වෙළඳසැලකට රුපියල් මිලියන 2.5 බැගින් ලබා දී ඇත.

02. සමුපකාර රෝහල් නවීකරණය

සමුපකාර රෝහල් මගින් ශ්‍රී ලංකේය සාමාන්‍ය ජනතාව සඳහා ලබා දෙන්නාවූ සේවය අතිමහත්ය. එම සේවාව තව තවත් පුළුල් කිරීමේ අරමුණින් මෙම වසර තුළදී සමුපකාර රෝහල් කිහිපයක නවීකරණ කටයුතු සිදු කර ඇත.

මේ අනුව ගාල්ල, කුරුණෑගල හා එරාවූර් සමුපකාර රෝහල් නවීකරණය කොට ඇත. මෙහි අරමුණ වී ඇත්තේ එම ප්‍රදේශ වල ජනතාව වෙත ගුණාත්මයෙන් ඉහළ රෝහල් සේවාවක් සැපයීමයි.

ගාල්ල සමුපකාර රෝහල නවීකරණය කිරීම සඳහා අතිරික්ත අරමුදලෙන් රුපියල් මිලියන 50ක් ද කුරුණෑගල සමුපකාර රෝහල පුළුල් කිරීම සඳහා රුපියල් මිලියන 87.5 ක මුදලක් ද වැය කළ අතර එරාවූර් සමුපකාර රෝහල නවීකරණය සඳහා රජයේ මූලධන ප්‍රතිපදාන යටතේ රුපියල් මිලියන 4ක මුදලක් මෙම වසර තුළ වැය කොට ඇත.



03. ජයන්තිපුර නිවාඩු නිකේතනය ඉදිකිරීම

සමුපකාර ව්‍යාපාරය වර්තමානයට උචිත අයුරින් වෙනස් කිරීමේ අරමුණින් ජයන්තිපුර නිවාඩු නිකේතනය ඉදි කිරීම මෙම වසර තුලදී සිදු කර ඇත. මෙමගින් දැනට පවතින සේවාවන් වඩාත් පුළුල් කොට ජනතාව වෙත වැඩි පහසුකම් ලබාදී තිබේ. මේ සඳහා රජයේ මූලධන ප්‍රතිපාදන යටතේ රුපියල් මිලියන 4 ක මුදලක් වැය කොට ඇත.



04. පිහිනුම් තටාකය ඉදි කිරීම

ග්‍රාමීය පාසල් සංවර්ධනය කිරීමේ අරමුණින් නිකවැරටිය මහසෙන් ජාතික පාසලේ පිහිණුම් තටාකය ඉදි කිරීම මෙම වසර තුළදී සිදු කරන ලදී. මෙමඟින් නිකවැරටිය අධ්‍යාපන කලාපයේ පාසල් ළමුන්ගේ පිහිනුම් ක්‍රීඩා කෞශල්‍ය ඉහළ මට්ටමකට ගෙන ඒමට හැකියාව ලැබෙන අතරම පාසල් ළමුන්ගේ සෞඛ්‍ය මට්ටම වඩා ඉහළ නැංවීමේ හැකියාව ලැබී ඇත. මෙමඟින් නාගරික පාසල් වල වූ පහසුකම් ග්‍රාමීය පාසල් වෙත ගෙන යාමට හැකිවිණි. මේ සඳහා අතිරික්ත අරමුදලින් රුපියල් මිලියන 11.4 ක් වෙන් කරන ලදී.



05. ඉන්ධනහල නවීකරණය

ලාංකේය ජනතාවගේ ජීවන තත්වය වඩාත් පහසු කරලීමේ අරමුණින් ඉදි කොට ඇති සමුපකාර ඉන්ධනහල් අතුරෙන් කොබෙයිගනේ ඉන්ධනහල නවීකරණය කිරීම මෙම වසර තුල දී සිදුවිය. නවීන පහසුකම් යටතේ පාරිභෝගිකයන් වැඩි පිරිසකට සේවා සැපයීමට හැකිවීම මෙමගින් ලැබෙන ප්‍රතිලාභයයි. මේ සඳහා අතිරික්ත අරමුදලෙන් රුපියල් මිලියන 10ක් වැය කොට ඇත.



06. මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයක් ලබාදීම

මාර්ග වැඩි දියුණු කිරීමේ පහසුව සඳහා නිකවැරටිය සංවර්ධන සමුපකාර සමිතිය වෙත මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයක් ලබාදීම මෙම වසර තුළ දී සිදුවිය. සමිතිය සඳහා ආදායම් උත්පාදන මාර්ගයක් ඇති කිරීම හා සමුපකාර ව්‍යාපාරය විවිධ ව්‍යාපාර ක්ෂේත්‍ර කරා යොමු කිරීම මෙහි අරමුණ වේ. සමුපකාර ක්ෂේත්‍රය විවිධ අංශ කරා යොමු කිරීම මගින් එය වඩාත් පුළුල් කිරීමේ හැකියාවක් ලැබේ. නිකවැරටිය සංවර්ධන සමුපකාර සමිතිය වෙත මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයක් ලබාදීම එහි මූලික පියවරක් ලෙස සැලකිය හැකිය. මේ සඳහා සමුපකාර අතිරික්ත අරමුදලෙන් රුපියල් මිලියන 19.5 ක මුදලක් වැය කොට ඇත.

07. ඒකාබද්ධ අත්‍යාවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමේ වැඩසටහන (චක්‍රීය අරමුදල)

පාරිභෝගිකයාට ගුණාත්මකභාවයෙන් ඉහළ අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩ 08 ක් සහනදායි මිලට ලබාදීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. පරිප්පු, සීනි, සුදුළූණු, වියලි මිරිස්, හාල් මැස්සන්, මුංඇට, සැමන් ටින්, කඩල යන අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩ සඳහා මිල කැඳවීම සිදු කරන අතර ජාතික මිල කමිටුව මගින් ඒකාබද්ධ මිල තීරණය කිරීම තුලින් සාධාරණ මිලට පාරිභෝගිකයාට මෙම අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩ මිලදී ගැනීමට හැකියාව ලැබී ඇත. ඒ සඳහා සමුපකාර අරමුදලින් රුපියල් මිලියන 250ක මුදලක් වැය කොට ඇත.

08. වෙබ් අඩවිය ප්‍රතිනිර්මාණය කිරීම

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි වෙබ් අඩවිය ප්‍රතිනිර්මාණය කිරීම මෙම වසර තුළ සිදු වූ තවත් සුවිශේෂී වූ සංවර්ධන කාර්යයකි. මෙමගින් ලොව පුරා වෙසෙන සෑම පුද්ගලයෙකුටම අප දෙපාර්තමේන්තුව සහ එමගින් සිදුවන සේවය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හැකියාව ලැබේ. සෑම පාර්ශවයකටම එසේ සමුපකාරික තොරතුරු ලබා ගැනීමේ පරාසය ඉහළ නැංවීම මෙහි ප්‍රධානතම අරමුණ වේ. මෙම වසර අවසන් වන විට එහි ප්‍රතිඵල අත්කර ගැනීමට අප දෙපාර්තමේන්තුවට හැකියාවක් ලැබීම අප ලද භාග්‍යයකි. මේ සඳහා රජයේ මූලධන ප්‍රතිපදාන යටතේ රුපියල් මිලියන 0.133 ක් වැය කොට ඇත.



09.        දැයට කිරුළ වෙළඳ හා අධ්‍යාපන ප්‍රදර්ශනය

දැයට කිරුල අධ්‍යාපන හා වෙළඳ, ප්‍රදර්ශනය සෑම වසරකදීම ලංකාවේ ප්‍රදේශ කිහිපයක් ආවරණය වන පරිදි පවත්වනු ලබන අංගයකි. පොලොන්නරුව, අම්පාර යන නගර කේන්ද්‍ර කර ගනිමින් මෙම වසරේදී ප්‍රදර්ශනය ඉතා සාර්ථකව පැවැත්විනි. මේ අවස්ථාව සඳහා සෑම වසරකම අප දෙපාරේතමේන්තුව සහභාගී වන අතර මෙවරද සමුපකාර ක්ෂේත්‍රය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම හා ඒ වෙත ජනතාව යොමු කර ගැනීමේ අරමුණින් විවිධ අංශයන්ගෙන් සමන්විත වන ප්‍රදර්ශන කුටියක් නිර්මාණය කෙරුණි.

මෙම වසර තුළදී මේ සඳහා රජයේ මූලධන ප්‍රතිපාදන  යටතේ රුපියල් මිලියන 1.4 ක් වැය කොට ඇත.




10.        මාධ්‍ය කටයුතු

රජයේ සංවර්ධන කටයුතු පිළිබඳ ලාංකේය ප්‍රජාව දැනුවත් කිරීම සහ සමුපකාර ක්‍රමය ප්‍රචලිත කිරීමේ අරමුණින් සමුපදීපනී පුවත්පත බිහිවිය. මෙය වසර 08ක් පුරා අඛණ්ඩව පවත්වාගෙන ගිය අතරම මෙම වසර තුළදී ද සාර්ථක ලෙසින් නිකුත් කිරීමට අප දෙපාර්තමේන්තුවට හැකි විය. සමුපදීපනී පුවත් පත සෑම මසකම අවසන් සිකුරාදා දිණමිණ හා තිනකරන් පුවත් පත් වල අතිරේකයක් ලෙස නිකුත් කෙරේ. මේ තුළින්  සමුපකාර සංවර්ධන කාර්යයන් වල ඌණතා මග හරවා ගනිමින් ජනතාවගේ සිතුම් පැතුම් වලට අනුකූල ලෙස කටයුතු කිරීමේ හැකියාව වර්ධනය වී ඇත.



2006 ජූනි මස 30 වන දින ඇරඹී සමූපදීපනී පුවත්පතේ සියවන කලාපය 2013 නොවැම්බර් මස මුද්‍රණය කොට එළිදැක්වීමට හැකියාව ලැබීම විශේෂ කරුණක් ලෙස සඳහන් කළ හැකිය.

පුවත්පතට තොරතුරු ලබා දෙන සම්බන්ධීකාරකරුවන් සඳහා මාධ්‍ය පුහුණුවක් ලබාදීම ද, සමුපකාර ව්‍යාපාරය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමේ අරමුණින් සමූපදීපනී පුවත්පත හරහා දහසින් බැඳි පියලි පැන විසඳුම් තරගාවලිය පැවැත්වීම ද මෙම වසර තුළදී සිදු විය.

සමූපදීපනී පුවත්පත සමුපකාරය ප්‍රචලිත කිරීම සඳහා මහත් වූ සානුබලයක් සපයනු ලබයි.

11. ග්‍රාමීය බැංකු නියාමන ඒකකය මඟින් සිදු කළ සංවර්ධන කටයුතු

සමුපකාර ක්ෂේත්‍රයේ මූල්‍ය ක්‍රියාකාරකම්හි නියුතු සමිති හා සංගම් වල මූල්‍ය විනයක් ඇති කිරීම, එම අංශ ශක්තිමත් කිරීම හා යහපාලනය තුළින් සමුපකාර මූල්‍ය අංශය ව්‍යාප්ත කිරීම අරමුණු කොටගෙන 2013 වර්ෂයේ මැයි මසදී දෙපාර්තමේන්තුව තුළ බැංකු නියාමන ඒකකය ස්ථාපිත කරන ලදී. සමුපකාර ආයතන වල තැන්පත්කරුවන්ගේ මුදල් වල ආරක්ෂාව සැලසීම මෙම නියාමන ඒකකයෙහි ප්‍රධානතම අරමුණක් විය. මේ සඳහා බැංකු නියාමන ජාතික කමිටුවක් ද සෑම පළාතකම පළාත් නියාමන කමිටු ද ස්ථාපිත කරන ලද අතර මෙම කාලය තුළ උතුරු පළාත හැර අනෙකුත් පළාත් වල සමිති හා දෙපාර්තමේන්තු නිලධාරින් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් පැවැත්වීමද ඊට අමතරව මූල්‍ය සේවා සමිති හා ග්‍රාමීය බැංකු වල තොරතුරු රැස් කොට සමාලෝචනය කිරීම, පළාත් කොමසාරිස් වරුන් වෙත උපදෙස් පත්‍රිකා නිකුත් කිරීම, සණස හා විසේස සමිති සඳහා ඒකීය ගිණුම් ආකෘති නිර්මාණය කිරීම ද සිදු කරන ලදි.






එසේම මෙම වසර තුලදී සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය වන පරිදි පුහුණුකරුවන් කණ්ඩායමක් තෝරාගෙන එම නිලධාරින් පුහුණුකරුවන් ලෙස සංවර්ධනය කිරීම හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ද සිදු කර ඇත.

මෙලෙසින් බැංකු නියාමන ඒකකය මගින් සමුපකාර ක්ෂේත්‍රයේ මූල්‍ය සමිති හා ග්‍රාමීය බැංකු වල සංවර්ධනය සඳහා සුවිශේෂී කාර්යභාරයක් මෙම වසර තුලදී සිදු කර ඇත.

## 12. සැලසුම් සකස්කිරිම හා තොරතුරු පද්ධතියක් පවත්වා ගැනීම

සමුපකාර ව්‍යාපාරය පිළිබඳ ප්‍රජාව හා ලාංකේය ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් 2012 කාර්ය සාධන වාර්තාව සහ සංඛ්‍යා ලේඛන වාර්තාව  වඩාත් විධිමත්ව සකස් කිරිම මෙම වසර තුළදී සිදුවිය. මෙහිදී අප දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි සමිති/ සංගම් හා පළාත් දෙපාර්තමේන්තු යටතේ සමිති/ සංගම් වල තොරතුරු ඒකරාශි කොට ඒවා ඒකාබද්ධ කර සංඛ්‍යා ලේඛන වාර්තාව සකස් කරනු ලබන අතර මෙම වාර්තාව සමුපකාරිකයන්ගේ මෙන්ම ව්‍යාපාරය පිළිබඳ උනන්දුවක් දක්වන ශ්‍රී ලාංකික ප්‍රජාවට වැදගත් වේ.

එසේම දෙපාර්තමේන්තුව විසින් මෙම වසරේ දී සිදු කරනු ලැබූ සමස්ත කාර්යයන් ඇතුලත් කොට කාර්ය සාධන වාර්තාව සකස් කර පාර්ලිමේන්තුව වෙත සභාගත කිරීමට යොමු කරන ලදී. තවද තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම යටතේ ශ්‍රී ලංකා මහා බැංකුව, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව වැනි ආයතන වෙත සමුපකාර ව්‍යාපාරය සම්බන්ධ තොරතුරු නිවැරදි හා කාර්යක්ෂමව ලබාදීම ද මෙම වසර තුලදී සිදුකරනු ලැබූ කාර්යයන් ලෙසට හැඳින්විය හැකිය.



# 03 පරිච්ඡේදය

## ජාතික මට්ටමේ සමුපකාර සංවිධාන

වර්ෂය තුළ ජාතික මට්ටමේ සමුපකාර සංගම් 12ක් ක්‍රියාකාරි තත්ත්වයේ පවතින ලදී. අප දෙපාර්තමේන්තුව විසින් එකී සංගම් හී කළමනාකරණ හා ව්‍යාපාරික කටයුතු සඳහා මගපෙන්වමින් හා ඒ සඳහා සානුබල සපයමින් ඒවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳව සෘජු අධීක්ෂණය සපයන ලදී.

### 03.1 වර්ෂය තුළ ක්‍රියාත්මක වූ සංගම්

| | සංගමයේ නම | ලියාපදිංචි අංකය | ලියාපදිංචි දිනය | සාමාජික සංඛ්‍යාව | සේවක සංඛ්‍යාව | ලාභ තත්ත්වය රු.මි. | මුළු වත්කම් රු.මි. |
|---|---|---|---|---|---|---|---|
| 01 | සී/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය | සී 2490 | 1972.07.26 | 26 | 52 | -20.87 | 1019.95 |
| 02 | සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය | සී 1086 | 1942.04.01 | 8 | 18 | 0.97 | 68.91 |
| 03 | සී/ස ශ්‍රී ලංකා ජාතික ධීවර සමුපකාර සමිති මහා සංගමය | සී 1227 | 1952.02.02 | 247 | 05 | -0.30 | 9.74 |
| 04 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය | සී 2504 | 1973.03.01 | 159 | 141 | 2.41 | 605.75 |
| 05 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර කර්මාන්ත මහා සංගමය | සී 2527 | 1974.03.19 | 186 | 43 | 4.8 | 137.71 |
| 06 | සී/ස ශ්‍රී ලංකා සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිති මහා සංගමය | සී 2651 | 1980.11.10 | 445 | 25 | 4.08 | 441.29 |
| 07 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර පේෂ කර්මාන්ත සංගමය | සී 2559 | 1981.09.02 | 12 | 5 | 0.25 | 24.54 |
| 08 | සී/ස ශ්‍රී ලංකා තරුණසේවා සමුපකාර සමිති සංගමය | සී 2689 | 1986.01.01 | 25 | 9 | -1.53 | 19.18 |
| 09 | සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය | සමු 01 | 1989.09.15 | 247 | 136 | -1.55 | 497.30 |
| 10 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර ග්‍රාමීය බැංකු මහා සංගමය | සමු 17 | 1997.12.15 | 13 | 13 | 2.97 | 1703.82 |
| 11 | සී/ස ශ්‍රී ලංකා සකසුරුවම් හා ණය ගණුදෙනු සමිති සම්පත් කළමනාකරණ සමුපකාර සන්ධානය | සමු 30 | 2005.11.21 | 7 | 3 | 0.24 | 21.04 |
| 12 | සී/ස ශ්‍රී ලංකා ආරෝග්‍යශාලා සේවා සමුපකාර සමිති මහා සංගමය | සමු 33 | 2007.02.23 | 10 | - | - | 0.39 |

## 03. 2 වර්ෂය තුළ ක්‍රියාත්මක වූ සමුපකාර සමිති

දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට හා මෙහෙයවීමට යටත්ව දීප ව්‍යාප්ත ප්‍රාථමික සමුපකාර සමිති 35ක් 2013 වර්ෂය තුළ ක්‍රියාත්මක විය. මෙම සමුපකාර සමිති ප්‍රධාන කාණ්ඩ 02කට වර්ග කර දැක්විය හැකිය.

- දීප ව්‍යාප්ත මූල්‍ය සේවා සමුපකාර සමිති
- දීප ව්‍යාප්ත නිෂ්පාදන හා සේවා සමුපකාර සමිති

## 03. 2.1 දීප ව්‍යාප්ත මූල්‍ය සේවා සමුපකාර සමිති

බහුතරයක් රාජ්‍ය හා පෞද්ගලික ආයතන වල සේවකයින් සාමාජිකත්වය දරන සකසුරුවම්කම හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිති වේ.

මෙම සමුපකාර සමිතිවල මූලික කාර්යයන්

- ❖ සමාජික ඉතුරුම් රාශිකරණය
- ❖ සාමාජිකත්වයට ණය පහසුකම් සැපයීම
- ❖ සාමාජික සුභ සාධන කටයුතු (මරණාධාර, ශිෂ්‍යත්ව ආධාර, වෛද්‍යාධාර, පාරිභෝගික සේවා සැපයීම)
- ❖ ව්‍යාපාරික කටයුතු (විශ්‍රාම ශාලා, නිවාඩු නිකේතන, උකස් සේවා, මුද්‍රණාල සේවා, රක්ෂණ නියෝජිත සේවා)

# දීප ව්‍යාප්ත ආයතනික මූල්‍ය සේවා සමුපකාර සමිති - 2013

| | සමිතියේ නම | ලි. ප. අංකය | ලි. ප. දිනය | සාමාජික සංඛ්‍යාව | සේවක සංඛ්‍යාව | ලාභ/අලාභ තත්වය රු.මි. | මුළු වත්කම් රු.මි. |
|---|---|---|---|---|---|---|---|
| 01 | සී/ස රාජ්‍ය සේවා සමුපකාර ණයදීමේ හා ඉතිරි කිරීමේ සමිතිය | සී 326 | 1926.12.31 | 10930 | 30 | 40.04 | 612.24 |
| 02 | සී/ස බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අන්‍යෝන්‍ය අර්ථසාධක අරමුදල් සමුපකාර සමිතිය | සී 473 | 1928.03.15 | 3828 | 04 | 1.22 | 81.33 |
| 03 | සී/ස තැපැල් හා ටෙලිකොම් සේවක සමුපකාර බැංකු සමිතිය | සී 503 | 1928.12.07 | 12717 | 34 | 8.07 | 1533.72 |
| 04 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සකසුරුවම් සහ ණය දෙන සමිතිය | සී 736 | 1930.11.01 | 157616 | 601 | 263.09 | 9116.70 |
| 05 | සී/ස ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය කාර්ය මණ්ඩල සංවර්ධන සේවා ස.ණ.ස | සී 744 | 1930.11.10 | 4215 | 10 | 11.42 | 256.35 |
| 06 | සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම්කම සහ ණය ගනුදෙණු පිළිබඳ සමිතිය | සී 290 | 1938.03.30 | 41107 | 73 | 11.54 | 2373.75 |
| 07 | සී/ස ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සකසුරුවම්කම සහ ණය ගනුදෙණු සහ සුභසාධක සමුපකාර සමිතිය | සී 303 | 1938.04.28 | 920 | 02 | 1.41 | 46.71 |
| 08 | සී/ස රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ සේවකයින්ගේ සකසුරුවම් සහ ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සී 255 | 1939.10.20 | 865 | 02 | 1.35 | 25.30 |
| 09 | සී/ස දුම්රිය ස්ථානාධිපතිවරුන්ගේ සහ ලිපිකරුවන්ගේ සමුපකාර සකසුරුවම් ඉතිරි කිරීමේ හා ණය දෙන සමිතිය | සී 1649 | 1949.03.29 | 1180 | 04 | 0.17 | 54.13 |
| 10 | සී/ස දුම්රිය මාර්ග හා වැඩ දෙපාර්තමේන්තුවේ සකසුරුවම් හා ඉතිරිකිරීමේ සමුපකාර සමිතිය | සී 1707 | 1950.08.30 | 152 | 01 | 0.34 | 27.60 |
| 11 | සී/ස සෞඛ්‍ය සේවා මුදල් ඉතිරි කිරීමේ සහ ණය ගනුදෙණු පිළිබඳව සමුපකාර සමිතිය | සී 2233 | 1959.11.19 | 17590 | 31 | 2.75 | 700.49 |
| 12 | සී/ස ලංගම සේවක සකසුරුවම් හා සුභසාධක සමුපකාර සමිතිය | කේ.ඊ. 299 | 1960.05.26 | 4903 | 07 | 1.9 | 65.42 |
| 13 | සී/ස මහජන බැංකු සේවක සමුපකාර සමිතිය | සී 2266 | 1962.02.10 | 6898 | 08 | 4.72 | 36.87 |
| 14 | සී/ස සතොස සේවකයින්ගේ සමුපකාර සකසුරුවම් සුභසාධක සහ ණය දෙණ සමිතිය | සී 2294 | 1963.01.26 | 741 | 04 | 3.67 | 30.98 |
| 15 | සී/ස බ්‍රවුන් හවුලේ කාර්මික හා පොදු සේවා සකසුරුවම් සහ ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සී 2383 | 1967.10.01 | 252 | 01 | 0.21 | 26.67 |
| 16 | සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථායීය සකසුරුවම්කම හා ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සී 2402 | 1968.08.29 | 1370 | 07 | 1.92 | 104.6 |
| 17 | සී/ස දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ ඉතිරි කිරීමේ සමුපකාර සමිතිය | සී 931 | 1973.07.25 | 1188 | 03 | 1.01 | 62.24 |
| 18 | සී/ස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක සමුපකාර බැංකු සමිතිය | සමු 02 | 1989.12.20 | 7471 | 19 | 0.61 | 929.39 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 19 | සී/ස මිනින්දෝරු (මැනුම්) දෙපාර්තමේන්තුවේ මැනුම් සහයකරුවන්ගේ සකසුරුවම් හා ණය ගනුදෙණු පිළිබඳ සුහසාධක සමුපකාර සමිතිය | සමු 10 | 1994.02.09 | 1155 | - | 0.81 | 8.11 |
| 20 | සී/ස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින්ගේ සුහසාධක සකසුරුවම්කම හා ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සමු 16 | 1997.09.27 | 2931 | 11 | 1.91 | 90.04 |
| 21 | සී/ස ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ සංවර්ධන සේවා සමුපකාර සමිතිය | සමු 18 | 1998.04.06 | 55228 | 45 | -16.4 | 4560.9 |
| 22 | සී/ස සණස සංවර්ධන බැංකුවේ සේවක සණස සමිතිය | සමු 22 | 2000.06.26 | 531 | 1 | 0.65 | 14.04 |
| 23 | සී/ස සමෘද්ධි සංවර්ධන හා කෘෂිකර්ම පර්යේෂණ සහකාර නිලධාරින්ගේ සකසුරුවම් හා ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සමු 25 | 2001.05.05 | 6563 | 06 | 4.23 | 57.88 |
| 24 | සී/ස ජල සම්පාදන මණ්ඩලයේ සමස්ත සේවකයින්ගේ සකසුරුවම් හා ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සමු 31 | 2006.01.03 | 107 | - | 0.08 | 4.88 |
| 25 | සී/ස රාජ්‍ය සේවා උපාධිධාරි සකසුරුවම් හා ණය ගනුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | සමු 32 | 2006.11.29 | 61 | - | 0.04 | 0.86 |

## 03. 2.1 දීපව්‍යාප්ත නිෂ්පාදන හා සේවා සමුපකාර සමිති

පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා අවශ්‍ය නිෂ්පාදන හා සේවා සපයන ප්‍රාථමික සමුපකාර සමිති දීපව්‍යාප්ත නිෂ්පාදන හා සේවා සමුපකාර සමිති ලෙසින් හඳුන්වාදිය හැකිය.

මෙම සමිති වල මූලික කාර්යයන්

- ❖ සාමාජිකයන්ගේ නිෂ්පාදන මිලදී ගැනීම
- ❖ නිෂ්පාදන හා සේවා සැපයීම සඳහා සාමාජිකයින්ට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබාදීම
- ❖ සාමාජිකයින්ගේ නිෂ්පාදන සඳහා වෙළඳපොල හඳුන්වාදීම සහ වෙළඳපොල අවස්ථා පුළුල් කිරීම
- ❖ සාමාජිකයින් සඳහා තාක්ෂණික මෙවලම් හා නවීන තාක්ෂණය හඳුන්වාදීම

| | සමිතියේ නම | ලියාපදිංචි අංකය | ලියාපදිංචි දිනය | සාමාජික සංඛ්‍යාව | සේවක සංඛ්‍යාව | ලාභ/අලාභ තත්වය රු.මි. | මුළු වත්කම් රු.මි. |
|---|---|---|---|---|---|---|---|
| 01 | සී/ස මුද්‍රණ ශිල්පීන්ගේ සමුපකාර සමිතිය | සී 2280 | 1962.08.10 | 310 | 13 | 0.20 | 54.87 |
| 02 | සී/ස සමස්ත ලංකා විචිත්‍ර පැළැටි හා උඩවැඩියා සමුපකාර සමිතිය | සී 2409 | 1969.11.28 | 4967 | 12 | 0.4 | 4.25 |
| 03 | සී/ස සමස්ත ලංකා අභ්‍යාස පොත් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය | සමු 03 | 1990.03.07 | 54 | 07 | -1.1 | 12.99 |
| 04 | ශ්‍රී ලංකා මාදැල් හිමියන්ගෙ සමුපකාර සමිතිය | සමු 07 | 1992.01.29 | 423 | - | 0.0004 | 0.84 |
| 05 | සී/ස වතු සේවක නිවාස ස.ණ.ස | සමු 28 | 2003.07.11 | 3270 | 01 | 1.34 | 28.91 |
| 06 | සී/ස සමස්ත ලංකා සුළු හා මධ්‍යම පරිමාණ ධාන්‍ය සැකසුම්කරුවන්ගේ ව්‍යාවසායකත්ව සංවර්ධන සමුපකාර සමිතිය | සමු 34 | 2007.03.07 | 337 | 01 | 0.55 | 1.96 |
| 07 | සී/ස නිවාස හා දේපළ සමුපකාර සංවර්ධන සමිතිය | සමු 39 | 2011.07.07 | 15 | - | 0.34 | 3.24 |
| 08 | සී/ස රජරට විශ්වවිද්‍යාලීය සමුපකාර සමිතිය | සමු 40 | 2011.08.28 | 138 | - | 0.97 | - |
| 09 | සී/ස සමස්ත ලංකා කෘෂි කාර්මික සමුපකාර සමිතිය | සමු 41 | 2012.01.05 | 28 | 3 | 0.41 | 1.35 |